# නූතන ඇඳුම සමග අපේ ගමන් මග - විශ්ව ගම්මානය හරහා




ආහාර පාන, බේත් හේත්, මෙන්ම ඇඳුම් පැළඳුම් ද අයත් වන්නේ මිනිසාගේ අනවශ්‍ය භාණ්ඩ අතරටය. අතීතයේදී සොබාදහම හා ඒකානුබද්ධව තදින් දැනුන ඇඳුම් පිළිබඳ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා උපයෝගී කරගනු ලැබුවේද අවට පරිසරයෙන් ඔවුනට පහසුවෙන්ම සම්පාදනය කරගත හැකි වූ අමුද්‍රව්‍යයන්මය. උදාහරණයක් වශයෙන් ලංකාවේ ආදිවාසීන් වූ වැදි ජනතාව ඔවුනගේ ඇඳුම සඳහා මුල් කාලීනව ගස්වල කොල අතු භාවිතා කිරීම පෙන්වා දිය හැකිය.

අප කුඩා කළ සමාජ අධ්‍යනය පාඩමට ඉගෙන ගත් ආකාරයට මිනිසා මුලින් ම ඇඳුම් ඇඳීමට පටන් ගත්තේ ශරීර උෂ්ණත්වය ආරක්‍ෂා කර ගැනීමට, විලි වසා ගැනීමට, අලංකාරය සඳහා වැනි ප්‍රාථමික අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහාය. මානව සංහතියේ දියුණුවත් සමගම මිනිසා ඇඳුම පැළඳුම තුලින් මෙම අවශ්‍යතා සපුරාගැන්මෙන් සෑහීමකට පත් නොවී සමාජ අවශ්‍යතාවයට අනුකූලව ඇඳුම් පැළඳුම් වල අද දක්වා විකාශනය සිදු කර ගන්නා ලදී.

ශ්‍රී ලාංකිකයන් වන අපගේ ඉතිහාසයේ කියවෙන අන්දමට ජාතියක් වශයෙන් අපට ඇඳුම් ඇඳීම සම්බන්ධව ඇත්තේ ලොව අන් කවර ජාතියකටත් නොදෙවෙනි වන අන්දමේ ශ්‍රේෂ්ඨ ඉතිහාසයකි. එයට හේතුව නම් විජය කුමරු පරිවාර සේනාව පන්සීයකුත් සමඟ එකල තම්බපන්නිය නමින් හැඳින්වුණ ශ්‍රී ලංකාවේ තම්මැන්නාව නම් තොටුපලින් රටට ගොඩබැස අවට සැරිසරන කල කුවේනී නම් යක්‍ෂ ගෝත්‍රික කුමරිය ඔහුට මුන ගැසී ඇත්තේ ඇය කපු කටිමින් සිටින අතරතුරදීය. එයින් අපට පැහැදිලි වන්නේ එම ගෝත්‍රික ජනතාව එකලද නූල් භාවිතය දැන සිටි බවය. විජය කුමරුට දාව කුවේනිට ඉපදුන ජීවහත්ත හා දිසාලා යන දරු දෙදෙනාගෙන් පැවත එනවායයි සැලකෙන වැදි ජනාතාව අපේ ආදීවාසීන් ලෙස අප සලකන්නේ නම්, ඇඳුම් පැළඳුම් සම්බන්ධයෙන් ආඩම්බර විය හැකි ඉතිහාසයකට ලාංකිකයන් වන අප උරුමකම් කියන්නෝ වෙමු.

සමාජ අවශ්‍යතාවයට අනුව ඇඳුම විකාශනය ගැන සලකන විට අපගේ රාජධානි සමය අපට ඉතාමත් වැදගත් වේ. කුල ක්‍රමයට අනුව සමාජය බෙදා වෙන් කර තිබූ මෙම සමය ඇඳුම සම්බන්ධයෙන්ද ඉතා විශාල බලපෑමක් කර ඇත.

විශේෂයෙන්ම රාජධානි සමයේ කාන්තා ඇඳුම සම්බන්ධයෙන් සලකන විට මෙය ඉතාම පැහැදිලි ලෙස අපට දැකිය හැකිය. උඩුකය වසන හැට්ටය ඇඳීමේ අවසරය තිබුණේ කුලීන කාන්තාවන්ට පමණක් වන අතර කුලහීන ලියන්ට උඩුකය වසා ගැනීමට අවසරය තිබුණේ රෙදි කඩකින් පමණි. පුරුෂ පක්‍ෂය සඳහා ද එය එසේම විය. තම තමන්ට නියම වූ රැකියාවන්ට අනුව කුල වලට බෙදා මිනිසුන් වෙන් කල එකල "රජත" නමින් හැඳින්වූ පහත් යැයි සම්මත කුලයකට බෙදා වෙන්කල මිනිසුන් විසින් කුලීන පවුල්වල කිලිටි රෙදි සේදීම තම ජීවනෝපාය ලෙස කරන ලදී.

මින් අනතුරුව ලංකාවේ සිදුවූ විදේශීය ආක්‍රමණයන් පිළිවෙලින් පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි සමය ගැන සැලකිල්ලෙන් බලන කල මෙම ඇඳුම සම්බන්ධයෙන් රජුන් විසින් පනවා තිබූ රාජනීතිය උඩුයටිකුරු වී ගියේ මේ කාලවකවානුවේදී බව අපට පැහැදිලි වේ. ලංකාවේ කාන්තාව රෙදි හැට්ට, ඔසරියට අමතරව ගවුමට යොමු වූයේ මෙම කාලයේදීය. රාජ්‍ය පාලනය අහෝසි වීමත් සමගම කුලීන, කුලහීන පවට අනුව ඇඳුම් ඇඳීමේ පිලිවෙලද සමාජයෙන් තුරන්වීමට පටන් ගනී.

මිනිසුන්ගේ තරාතිරම පෙන්වීමේදීද ඇඳුමට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. සිංහල රජ සමයෙන් පසු මුදලි, මුහන්දිරම්, රටේ මහත්තයා, ආරච්චිලා, විදානේ වැනි බ්‍රිතාන්‍ය රජු යටතේ රාජකාරී කළ අයවලුන්ගේ නිල ඇඳුමින් ඔවුන් එකිනෙකාට වෙනස් විය. සුදු ආණ්ඩුවෙන් පසුවද මෙය තව දුරටත් විකාශනය වූවා මිස පරිහානියට පත්වූයේ නැත. කබායේ හෝ තොප්පියේ ඇති පදක්කම්, තරු, පටි වලින් ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්ගේ ඔවුන් අයත් වන නිලධාරී ශ්‍රේණිය හෙලි කිරීම හොඳම උදාහරන ලෙස ගත හැක.

වත් පොහොසත්කම් උගත්කම් ආදියද ඇඳුම තුලින් ප්‍රකට වන තවත් දේ ලෙස පෙන්විය හැක. පෙර කළදී නම් කලිසම්, කබාය හැඳ ටයි පටිය පැලැන්දෝ ඉංග්‍රීසි උගත්හු වෙති. සිංහල, පාලි, සංස්කෘත උගතුන්, වියතුන් ජාතික ඇඳුමින් සෑහීමට පත් වෙද්දී ඉංග්‍රීසි උගතුන් යුරෝපීය ඇඳුම් කට්ටලය ඇඳි ඝර්ම කලාපයට අයත් රටක් වන ශ්‍රී ලංකාවේ දේශගුනයෙන් අත්වන මහත් පීඩනය යටපත් කර දැමුවේ ඉංග්‍රීසි බය උගත්කම පිළිබඳව ඔවුන්ගේ වූ මහත් ආඩම්බර හා අභිමානය උස්කර තබමිනි.

ඇඳුම් පැලඳුම් තුලින් වත් පොහොසත්කම් උද්දීපනය කිරීමේදී නම් ස්ත්‍රී පක්‍ෂය සිටිනුයේ පුරුෂ පක්‍ෂයට වඩා බොහෝ ඉදිරියෙනි. එය නම් අතීතය, වර්තමානය මතු නොව අනාගතයේදී ද කිසිම වෙනසකට බඳුන් නොවනු ඇත. යමක් කමක් ඇති උදවිය ඇඳුම පැලඳුමට වියදම් කරනුයේ අත දිග හරිමිනි. කාන්තාවන්ගෙන් සමහරෙක් නම් බඩට කෑමටත් වඩා ජයට ඇඳ පැලඳීමට දක්වන්නේ මහත් උනන්දුවකි.

ඇඳුම සම්බන්ධයෙන් තවදුරටත් කතා කල ස්ත්‍රී පුරුෂභාවය අනුව, වයස අනුව සහ අවස්ථා-ව නැතහොත් ස්ථානය අනුව වැනි තවත් සමාජ අවශ්‍යතාවයනට අනුකූලව එය නැවතත් වෙනස් වන ආකාරය අපට පැහැදිලි වේ.

විලාසිතා ලැදි කම නිසාවෙන් පහසුව උදෙසා වැනි නොයෙකුත් හේතු නිසා ලාංකික කත යුරෝපීය කලිසම ඇඳීමට පටන් ගත්තත් පුරුෂ පක්‍ෂය තවමත් සාරි, ඔසරි, ගවුම් ඇඳීමට පසුබට වන්නේ ස්ත්‍රී පුරුෂ භාවයට අනුව ඇඳුමෙහි වෙනසක් ඇති නිසාවෙනි. අනික් කාරනය වන්නේ වයසට ගැපෙන ආකාරයට ඇඳුම් පැලඳුම් වෙනස් කර ගත යුතු බවය. දරුවන් කුඩා කාලයේ අන්දවනු ලැබූ "සන් සූට්" එකකින් වැඩිහිටියෙකු සැරසී සිටිනු දුටුවහොත් බැලූ බැල්මට එතැන නොගැලපීමක් විහිළුවක් ඇති බව හැඟී යන්නේ එය එම වයසට නොගැලපෙන ඇඳුමක් නිසාවෙනි. කණගාටුවෙන් වුවත් මෙම අවස්ථාවේ නොලියාම බැරි කරුණක් වන්නේ අපේ කාන්තා පක්ෂයේ සමහරෙක් දැන හෝ නොදැන මෙම නොගැලපෙන ඇඳුම් ඇඳීම හේතු කරගෙන සමාජයේ හාස්‍යයට පිලිකුලට ලක්වන ප්‍රවනතාවයක් අද දින දක්නට ඇති බවය. වැඩිහිටි වූ දූ දරුවන් සිටින මෑණිවරුන් තමන්ට නොගැලපෙන ආකාරයට කොට ඇඳුම් ශරීරයට හිර වෙන්නට අඳිමින් ශරීර අවයව උලුප්පා දක්වමින් සමාජයට දෙන්නේ නරක ආදර්ශයකි. ස්ත්‍රී දූෂණ නොයෙකුත් කාන්තා හා ළමා අපචාර වැනි සමාජ දූෂනයන්ට මෙවන් කාන්තාවන්ගේ හැසිරීමද යම් තරමක් හෝ පිටුවහලක් වන බව මගේ පෞද්ගලික මතයයි. එවන් කාන්තාවන් දෙස සමාජය වපර ඇසින් බැලීම නිරායාසයෙන්ම සිදුවන්නකි.

ඇඳුම පැළඳුම අවස්ථාවට අනුකූලව ඇඳීම අනිවාර්යයෙන්ම කල යුතු වන්නේ එසේ නොවුනහොත් එතැන ඇතිවන්නේ මහත් අවුලක් නොහොත් නොගැලපීමක් නිසාවෙනි. කුඹුරට, හේනට අඳින ඇඳුමින් සැරසී අප මංගල උත්සවයකට හෝ ආගමික උත්සවයකට සහභාගි නොවන්නේ ඒ නිසාය.

එනමුත් අප අද සමාජය දෙස විමසිල්ලෙන් බලන කල බොහෝ දෙනෙක් මෙම අවස්ථාවට අනුව ඇඳුම වෙනස් විය යුතු බව අවබෝධ කරගෙන නොමැති ආකාරයක් අපට දැකිය හැකිය. පසුගිය ජනවාරි පළමුවැනිදා පංසල් ගිය මගේ යෙහෙලියක් දුටු සත්‍ය සිදුවීමක් මෙයට ඉතාම හොඳ උදාහරනයක් ලෙස ගත හැකිය. ඉනටත් පහලින් අඳින අළුත් විලාසිතාවේ කලිසමකින් සහ ඉතාම කොට බිලවුස් එකකින් සැරසුන තරුණ දියණියක් සමග පංසලට පැමින සිටි මවක් ස්වාමීන් වහන්සේට වැඳ නව වසරට ආශිර්වාද ලබා ගැනීමට ගොස් පත් වූයේ මහත් අසීරුතාවයකටය. එම දෙදෙනා පසඟ පිහිටුවා ස්වාමීන් වහන්සේට වැඳීමට උත්සහ කරද්දී පහලට ගිය කලිසමිනුත් ඉහලට එසවුන බිලවුස් එකෙනුත් යුක්තව තම දියණිය දුටු මව කලිසම ඉහලට ඔසවන්නටත් බිලවුස් එක පහලට අදින්නටත් අසාර්ථක උත්සහයක යෙදුනේලු. මගේ යෙහෙලියට අනුව නම් එතැනදී වඩාම අසරණ වී ඇත්තේ උඩ බලන්නදැයි බිම බලන්නදැයි සිතා ගැනීමට නොහැකිව වික්ෂිප්ත බවට පත්වූ ස්වාමීන් වහන්සේලු.

මා ඉහතින් සඳහන් කලේ එක්තරා උදාහරනයක් පමනි. ලංකාවේ සිට ඔස්ට්‍රේලියාවට පැමින සිටින සමහර දෙමව්පියන් තම තරුණ දූ වරුන්ට ඇඳුම් අන්දවන ආකාරය ඉතාම කණගාටුදායකය. කාන්තාවකගේ නියම සුන්දරත්වය ඔප්නැංවෙන්නේ අඩක් නිරුවත් වූ විට නොව තමන්ගේ ශරීරයට ගැලපෙන ඇඳුම් ආයිත්තමින් සංවර ලෙස ශරීරය වසා ගත් විට බව ඔවුන් වටහා නොගන්නේ මන්දැයි ප්‍රශ්නයකි.

අප ජීවත් වන කාළයට, දේශයට අනුරූපව අපේ ඇඳුම වෙනස් විය යුතු නමුත්, එම වෙනස සිදු කර යුත්තේ විජාතිකයන් මෙන් බාගෙට නිරුවතින් හිඳිමින්දැයි යන්න දෙවරක් සිතා බැලිය යුතු කරුනකි.

ගල් යුගයේ සිට විශ්ව ගම්මානය කරා දියුණුවේ නිම් වලලු පුළුල් කර ගනිමින් අපි පැමින සිටින්නෙමු. ඒහා සමගම ඇඳුමද සමාජය අවශ්‍යතාවයනට අනුකූලව නානාවිධ වෙනස්කම් වලට භාජනයවෙමින් අපත් සමඟ ඉතා දිගු ගමනක් පැමින සිටී. නමුත් මිනිසා ශිෂ්ඨාචාර වීමත් සමගම මුලින්ම ඇඳුමක අවශ්‍යතාවය දැනුන අවස්ථාවෙහි සඳහන් කල එක කරුනක් වන විලි වසා ගැනීම සම්බන්ධයෙන් සිතන කල නූතන විලාසිතාවේ සමහර ඇඳුම් තුලින් එම කාරනය හරියාකාරව ඉෂ්ඨ වේදැයි යන්න ගැටළුවකි.

එසේ නොවුන හොත් අද ඇඳුමට මිනිසා බලාපොරොත්තු වූ ප්‍රාථමික අවශ්‍යතාවයන් වත් සපුරාලිය නොහැකිව තිබේ යැයි පැවසුවහොත් එය අසත්‍යයක් නොවනු ඇත. මෙහි තේරුම ඇඳුමෙහි විකාශනය අනාගතය කරා නොව අතීතය කරා පසුගමනක යෙදෙන බවද ? එසේත් නැතහොත් අප විශ්ව ගම්මානයේ සිට ගල් යුගය කරා ගමන් අරඹා ඇති බවද ?

සුභාෂිනී හේරත් - ඇට්වුඩ්